හෙන්රි ජයසේන

මගේ හටයෝ

මග තොට ලියූ කවියක්...
දුර බැහැර නාට්‍ය පුදර්ශනයකින් පසු
ආපසු එන ගමනේ ලියූ සටහනක්

දැන් නැත මුහුණේ සායම්
පීයේ එකම වීදුලි පහනේ
දුබල එළියේ
සිහින් දැල්කඩ
උන් වටා එහී
නිදි මගේ දරුවෝ ..

වසරක් දෙකක් නොව
වසර ගණනක්
හැදුනු වැඩුනු මා හා
මගේ දයාබර නිශාචරයෝ
කොහිද දරුවනේ
ගී හඬ
සිනා
අත්පොලසන්

ඩහදියෙන් තෙමුණු
ඇඳුම් ආයිත්තම් සමග
නමා තැබුවාද සුරු කිව
කැඩී බිඳී
ජරපත්ව ඇති
ඇඳුම් පෙට්ටියේ..?
ඔබට හැකිය දරුවනි
කවදා හෝ

සැන්දෑවක ජීවිතයේ
මතකයේ මංපුසාවෙන්
රැගෙන ඒ ගී හඬ
සිනා - අත්පොලසන්
ඩහදියෙන් තොරව
මුවග ඇති ව සතුටු සිනා
ඊට සවන් දෙන්නට..!

සිතයිද එවිට ඔබ මා ගැනත්..?

හෝරාවකට දෙකකට පෙර
රඟමඬලේ සිට
දහසක් දනන්ගේ
නෙත් පුදිත කළ
සිත් විවර කළ
මගේ හටයෝ..!

සිව් දිග සැරිසරා අප
යොදුන් ගෙවා දහසින්
එන මේ මඟ
දිනෙක යම්
නොසිටියි ද දරුවෙක්
මගේ හටයිනි
ඔබේ ශ්‍රමයෙන්
මිහිසකු වූ..?

අමනාප නොවන්න දරුවනි
රොස් පරොස් දෙඩුවාට
මගේ නිලයයි ඒ..!

අමනාප නොවන්න දරුවනි
නො දෙවුවාට මීයුරු තෙපුල්
වෙහෙසින්ය මා සිටියේ..!

පසුබට නොවන්න දරුවනි
එකුන් සියයක්
හිරීහැර
දකවර අඩුපාඩු තිබුනාට
අපේ උරුමයයි ඒ

දැන් නැත මුහුණේ සායම්
ඔබට හොරා
ඔබේ පියවි රුව දෙස
බලා සිටිමි මම
පීයේ පහනේ දුබල එළියේ
සිහින් කඩතුරාව යට
නිදන්න දරුවනි..!
පීයැදුරාණෙනි
සෙමින් පදවන්න පීය
මග පිරික්සා
අතුරු අන්තරා වලකා
පරෙස්සමෙන් ගෙන යන්න
අවදි නො කොට..
මේ මගේ දරුවෝ
මගේ හටයෝ
මගේ නිශාචරයෝ.. ..



දිනක් රජතුමා රාජ සභාවේදී අමති වරුන් සමඟ සිටිනා විටෙක අන්දරේ අමතා මෙසේ කීවේ ය

"අන්දරේ උඹ දන්නා ලොකුම බොරුව කියනවා බලන්න, කවියෙන්."

අන්දරේ ටිකක් කල්පනා කළා.

"ලොකුම බොරුව නේද රජතුමනි.. ඔන්න එහෙනම් අහගන්න..

ඔටුණු පැළඳ සිටියත් සිහසුණේ — මත
ඔබ ගොන් රජෙකි මේ මහ ගොන් රැළට — හිත
අදමිටු කුහක පාහර කමී ඉමක් — නැත
ඔබ වැනි අමනයෙක් සිරිලක හිටියෙ — නැත"

රජතුමාට හොඳටම කෝන්ති ගියා. කඩුව අමෝරාගෙන අන්දරේ වෙත කඩා පැන්නා.
රජ : මොකක්ද බොල හෝ කිව්වෙ?

"අන්දරේ : අවසර දේවයන් වහන්ස .. මා කිව්වේ මා දන්නා ලොකුම බොරුව තමයි.
රජ්පුරුවෝ ටිකක් කල්පනා කළා.

"ආ.. එහෙමද .. එහෙනම් කමක් නැහැ.." කියලා ආපහු ගිහින් සිංහාසනේ වාඩි වුණා. රජ්පුරුවො තාමත් කල්පනා කරනවා අන්දරේ කිව්වෙ ඇත්තක්ද බොරුවක් ද කියලා.

ශ්‍රීධර බුවනෙක

තුන්වන සීනුව

පසුගිය ලිපියේ කෝලම් ජන නාටක ගැන කෙටි හැඳින්වීමක් කළෙමි. මෙවර අපි කෝලම් නාට්‍යය පෙළ ගැසෙන ආකාරය මඳක් විමසමු.

කෝලම් රැඟුම් ඉදිරිපත් කෙරෙන්නේ සාමාන්‍යයෙන් ගෙමිදුලක හෝ පිටිවනියක එසේ නැත්නම් ඉඩ කඩ ඇති තැනක තනන ලද රඟ මඬලකය. ප්‍රේක්ෂකයෝ ඒ වටා රවුමට වාඩි වී සිටිති. ඇතැම් විට සමහරු ගරා යන් නැටුම්ව තනනා අයිලයට සමාන තොරණක් රඟ මඬල පසෙක සිටුවයි. මිරු රාක්ෂ, ගුරුළුරාක්ෂ, නාග රාක්ෂ, යන මෙවැනි
රාස්සයෝ රඟ මඬලට පැමිණීමට
පෙර අයිලය මත නැගී තම
භයානක වේශය රඟ දක්වා රඟ මඬලට පැමිණ නටති. මෙය ගරා යන් නැටුමේ අයිලය පැදීමට බෙහෙවින් සමානය. බෙරකරුවෝ දෙනෙක් සහ හොරණෑ වාදකයෙක් ද සිටිති.

කෝලම් රැඟුම් ආරම්භයේ දී එක් එක් චරිත කණ්ඩායමේ නායකයා විසින් හඳුන්වා දෙනු ලබයි. ඉන් පසු රඟ මඬලට පැමිණ නටයි.

මුලින්ම පැමිණෙන්නේ විදානෙ ආරච්චියි. ඔහු සමඟ ඔහුගේ ලියන්නා ද පැමිණෙයි. ඔහු අත පන්හිඳක් ද තල් අත්තක්ද ඇත. ලියන්නා තල් අත්ත විදානේ ආරච්චිගේ හිසට අල්ලයි. කියන කියනෑ ද් ලියා ගනියි. මෙම ජවනිකාවට අයත් කවි වලින් හා නැටුම් වලින් ගැමි උපහාසය මැනැවින් පිළිබිඹු වෙයි. උසස් තනතුරු දරන අය විවේචනය කරනු ලබන්නේ ඔවුන් උපහාසයට ලක් කිරීමෙනි. විදානේ හෙවත් ආරච්චි කෝලම වෙර මතින් සිටිනා සෙයක් නිරූපනය කොට ඇත්තේ ද උපහාසය සඳහාය.

නසා දුප්පත්	හැම
අසාධාරණ කරයි	මෙලෙස ම
ගසා කෙත් වතු	හැම
මෙසා එයි ආරච්චි	කෝලම

ලියන්නා ඔහු බලා සිටින විට පමණක් තල් අත්ත අල්ලයි. අනිත් වේලාවට ඔහුට රිසි දේ කරයි. මෙවුන් සැරසී සිටින්නේ වර්තමානයේ භාවිතා කරන ඇඳුම් වලින් ය. විශේෂයෙන් ආරච්චි නැමි පනාවක් හිසේ ගසා සිටියි.

මීළඟට හේවායෝ කීප දෙනෙක් පැමිණෙති. හේවා රාළ විස්තර කෙරෙන්නේ ඉතා ජුගුප්සා ජනක කෙනෙකු ලෙසටයි. ඔහුගේ නම බඩජල් ය.

නිරිඳුන් ගේ	පොරණ
සිටින තනතුරු	ලැබගෙන
නමින් බඩජල්	යන
බොළඳ මුක්කන් කුණෙන්	දැන් එන

හැම නලුවාම රඟ මඬලට පිවිස නැටවූ පසු කණ්ඩායමේ නායකයා ඔහුගෙන් ප්‍රශ්න අසා සංවාද ඇති කරයි. මෙම සංවාදයේ අදහස් වන්නේ හාස්‍ය රසය දැනවීමත් එම නලුවන් පිළිබඳ තවත් විස්තර ප්‍රේක්ෂකයාට දැනගන්නට සැළැස්වීමත් ය.

මීළඟට පැමිණෙන්නේ පනික්ක රාළ හෙවත් පණික්කලයා ය. ඔහු අණබෙර කෝලම ලෙස හඳුන්වනු ලබයි. මහල්ලෙක් ලෙස වෙවුලමින් බෙල්ලේ දවුලක් ද එල්ලාගෙන සබයට එයි. ඉන් පසු එන්නේ නොවේ අක්කා ය. හම ඇකිළී ගිය කම්මුල් යටට ගිය මැහැල්ලක වුවත් තරුණියක යන හැඟීමෙන් අන් අය දෙස බලයි.

දෙදෙනා නික්ම ගිය පසු ජේඩි විදානේ හෙවත් ජසයා පැමිණේ. කරේ රෙදි පෙට්ටනියක් බැඳ නොන්ඩි කකුලකින් පැමිණේ. ඔහුගේ බිරිඳ ලෙන්චිනා රූමත් කාන්තාවක් ලෙස විදානා පායි. අමු සැමි දබරය

ශ්‍රීනාත් මද්දුමගේ

කෝලම් හා ජන නාටක 2

මෙහිදී නිරූපණය කෙරෙයි. මින් අනතුරුව එන්නේ මුදලි කෝලමයි. ඔහුගේ වේශය සකස් කොට ඇත්තේ මෙකල මුදලිවරුන්ගේ නිල ඇඳුමට සමාන වන පරිදි ය. ඉන් පසු රජු, ඇමති, අග බිසව, යුව රජු සහ පිරිවර පැමිණෙති. අනතුරුව රාස්ස පාත්‍රයෝ පැමිණෙති. ගුරුළු, පූර්ණක, කව, මරු යන රාක්ෂයන්ගෙන් පසු ආඩි ගුරා පැමිණෙයි. මේ හැමටම පසු සම්පූර්ණ නාටක වශයෙන් හැඳින්විය හැකි කතා රඟ දක්වයි. ඒවා නම් සඳ කිඳුරු කතාව, ගොධයිම්බර කතාව, මනමේ කතාව සහ ගම කතාව ය.

කෝලම් නාටක වේදිකා නාට්‍ය කලාව සඳහා උපයෝගී කර ගැනීම පිළිබඳව පර්යේෂණ කළ සිංහල නාට්‍ය කරුවන් අතර දයානන්ද ගුණවර්ධන, මහාචාර්ය සරච්චන්ද්‍ර, ආචාර්ය එච් එම් ගුණසිලක, පරාක්‍රම නිරිඇල්ල, රෝහණ දන්දෙනිය සහ ජයලත් මනෝරත්න යන නාට්‍ය වේදීහු කැපී පෙනෙති. මෑතකදී ඔස්ට්‍රේලියාවේද රඟ දැක්වුණ දයානන්ද ගුණවර්ධන ශූරීන්ගේ අසය ලෙන්චිනා හා නර්බෝණා නාට්‍ය ය මේ සඳහා හොඳ උදාහරණයකි. ඔහු ජසයා ලෙන්චිනා පැරණි කෝලම් පිටපත උචිත අන්දමින් සංශෝධනය කර කෝලම් ශාලා වලසිස්ම් තබා ගනිමින් මේ නිෂ්පාදනය කළේ ය. මෙහිදී වෙස් මුහුණු වෙනුවට සැබෑ මුහුණු වලින් නූතන වේදිකා නාට්‍යයේ සම්මත අංග රචනා කරමින් කළ මේ නිර්මාණය ජනතා ප්‍රසාදය දිනාගත්තේ ය.

එමෙන්ම සරච්චන්ද්‍ර ශූරීන් යේ එළොව ගිහින් මෙළොව ආවා, පරාක්‍රම නිරිඇල්ල ගේ සෙක්කුව, රෝහණ දන්දෙනියගේ පරාස්ස කෝලම් ආකෘතිය හා ආභාසය ලැබූ නාට්‍ය කීපයකි. කෝලම් නාටයේ ඇති ගායනය, නර්තන විනෝදය මෙන්ම පොදුවේ රංග ආකෘතියත් සිංහල නාට්‍ය කලාවේ පෝෂණයට හේතු වූ බව පිළිගත යුතු ය.

කෝලම් නාට්‍ය වල එන දෙවක් කීපයක් රස විඳිමු.

නොංචි කෝලම අණබෙර කෝලම සමඟ කලහ කරගනියි. එතැනට පොලිස් කෝලම පැමිණෙයි.

පොලිස් කෝලම ඒයි.. ඒයි.. මොකද උඹලා දෙන්නා ඔතන රංඩු කරන්නේ...? දන්නේ නැද්ද අපේ මහා සම්මත භූමි පුත්‍රයන් වහන්සේ අද දවසේ මේ මාර්ගයේ ගමන් ගන්නා බව ..? සියලුම පුරුෂයින් ස්ත්‍රීන් ළමයින් බල්ලන් බළලුන් කොන් කරත්ත මාවතෙන් අයින් කර ගන්නට ආඥාවක් නිකුත් කරලා කියලා..

නොංචි
අනේ රාළහාමි මහා රජ්පුරුවො පාරේ ගියා කියලා අපේ කටයුතු නවත්තන්ට පුළුවන්නැයි.. අවසර පාර අපේ නේ .

පොලිස් කට වැඩියි
නොංචි දත් අඩුයි
පොලිස් තව අඩු කර ගන්න ඕනැද?
නොංචි නෑ මං අහන්නේ අවසර ඔය ආකාරයට රජ්පුරුවන්ට යන්න එක දවසයි
අණබෙර අමාත්‍ය තුමාට යන්ට එක දවසයි
නොංචි මුදලිතුමාට යන්ට එක දවසයි
අණබෙර තමුන්නැහැලට යන්න එක දවසයි පාර වැහුවම
නොංචි අපි කවද්ද පාරේ යන්නේ කියලා
පොලිස් අපි මොනවා කරන්නද බොල ඒකට? රටේ ආරක්සාවට බොහෝම තර්පන .. ඉතිං අපේ රාජකාරිය තමයි රාජ රාජ මහාමාත්‍යාදීන් ආරක්සා කරන එක
නොංචි එතකොට අවසර අභිංසක අපේ ආරක්සාව කවුද බලාගන්නෙ?
පොලිස් තම තමන්ගේ ආරක්සාව තම තමන් බලා ගත යුතුයි.
අණබෙර
ඕං දැනුයි තේරුං ගියේ.. අනේ අවසර එහේනම් තමුන්නැහේලා පුලුවන් ඉක්මනින් මෙතනින් ඉවත් වුනා නං හරි
පොලිස් ඒ මොකද බොල?
නොංචි අපේ ආරක්සාවට..